**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන-01 ව්‍යාපෘතිය - 2018.**

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 01 ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ 2.10 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය හා අංක 2948 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

---

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වනුයේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහ කොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම වේ. වැඩසටහන අපේක්ෂා කරනු ලබන්නේ (අ) කොළඹ නගරයේ ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ ව්‍යාප්ත කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම (ආ) මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම (ඈ) ආයෝජන වැඩසටහන කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කොටස් 12 ක් යටතේ ක්‍රියාත්මක වේ.ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එ.ජ.ඩො. මිලියන 112 ක් වන අතර ඉන් රු.මිලියන 11,088 කට සමාන එ.ජ.ඩො. මිලියන 84 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,696 කට සමාන එ.ජ.ඩො. මිලියන 28 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කරයි. වැඩසටහන එහි කටයුතු 2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව, වැඩසටහනේ කාලපරිච්ඡේදය 2019 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

වැඩසටහන වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
-

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

-----------------------------------------

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය කෙරේ.

| අනු අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ----- | --------------------- | ---------- | ---------------------------- | ----------------------- |
| (අ) | 2018 දෙසැම්බර් 31 දක්වා ණය ලබා දෙන ආයතනය විසින් අයකර ගත් එකතුව වූ එ.ජ.ඩො. මිලියන 2.13 ට සමාන රු. මිලියන 329.85 පොලී සහ බැදීම් ගාස්තු ගිණුම් වලට ගෙන නොතිබුණි. | ණය ශේෂය සඳහා වූ පොලී සහ බැදීම් ගාස්තු අඩුවෙන් දැක්වීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ලැබුණු උපදෙස් අනුව මෙම ව්‍යාපෘතිය යටතේ පොලිය සහ බැදීම් ගාස්තු ගිණුම් තැබීම සිදු නොකරන ලදී. එබැවින්, වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශයන්හි ගිණුම් සටහන් යටතේ පොලී සහ බැදීම් ගාස්තු අනාවරණය කර ඇත. | සමාලෝචිත වර්ෂය අවසානයේ දී අදාළ පිරිවැය ගිණුම්වලට ගෙන උපයෝජනය කරන ලද ණය වටිනාකම ලෙස නිරූපනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී විශේෂ (ඩොලර්) ගිණුමට කරන ලද ඌණ පුරණ වටිනාකම වූ එ.ජ.ඩො. 499,712 ට සමාන රු. මිලියන 84.59 ක් මූල්‍ය ප්‍රකාශනයන්ට ගෙන නොතිබුණි. තවද, 2018 සැප්තැම්බර් මාසයේදී ණය ලබා දෙන ආයතනය විසින් කරන ලද රු. මිලියන 7.46 ක සෘජු ගෙවීම් ගිණුම්වලට ගෙන | කෙරීගෙන යන වැඩ ගිණුම අඩුවෙන් දැක්වීම සහ මුදල් ශේෂය වැඩියෙන් දැක්වීම. | ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | විශේෂ (ඩොලර්) ගිණුමට කරනු ලබන ආපසු ගැනීම් සහ ඌණ පුරණයන් කාලීනව සැසඳිය යුතු බව. . |

නොතිබුණි. තවද, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන විශේෂ (ඩොලර්) ගිණුම්වල ශේෂය රුපියල් මිලියන 17.87 ක් වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සනාථ කරන ලද රු. මිලියන 95 ක අනුරූප ශේෂයන්ගේ එකතුව සමඟ එකඟ නොවීය.

## 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි සඳහා යොමු කිරීම | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| කොන්ත්‍රාත් ගිවිසුමෙහි පොදු කොන්දේසි | වැඩබිම් ඉංජිනේරුවන් විසින් සහතික කරන ලද බිල්පත් වැඩකරන දින 56 ක් ඇතුළත නිරවුල් කල යුතු වීම. කෙසේවෙතත්, මෙම වැඩසටහන මගින් රු. මිලියන 1,956.50 ක් සහ එ.ජ.ඩො. මිලියන 5.99 ක් වටිනා බිල්පත් දින 58 සිට දින 328 ක පරාසය දක්වා ප්‍රමාද වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 18.46 ක් සහ එ.ජ.ඩො. 43,316.53 ක මූල්‍ය ගාස්තු ගෙවීම් කර තිබුණි. | අමතර මූල්‍ය ගාස්තු දැරීමට සිදුවීම. | කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් පියවීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් මුදල් ලැබීම ප්‍රමාද විය. | නියමිත දිනට බිල්පත් පියවීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ එකඟතාවයකින් යුතු කාර්යක්ෂම යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| ක්‍රියාකාරකම් | අපේක්ෂිත ඉලක්කය | 2018 දෙසැම්බර් 31 දිනට ළඟා කරගත් ඉලක්කයන් | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) කොළඹ නගරයේ උතුරු ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය සඳහා පද්ධතිය පුනරුත්ථාපනය | | | ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ වීමේ හැකියාව සහ මෙහෙයුම් පිරිවැය වැඩිවීමේ හැකියාව | අදහස් දක්වා නොමැත. | වැඩ කඩිනම් කිරීම සඳහා පිළියම් යෙදිය යුතු අතර රේඛීය අමාත්‍යාංශය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් නිතිපතා වැඩසටහනේ ප්‍රගතිය නිරීක්ෂණය කළ යුතුය. |
| – නළ එලිම | මීටර 173,737 | මීටර 120,042 | | | |
| – ජල සම්බන්ධතා/ මාරු කිරිම් | නිවාස ඒකක 40,262 | නිවාස ඒකක 11,272 | | | |
| – කලාප මැනුම් ප්‍රදේශ ස්ථාපිත කිරීම | ප්‍රදේශ 16 | ප්‍රදේශ 05 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) කොළඹ නගරයේ නැගෙනහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය සඳහා වූ පද්ධතිය පුනරුත්ථාපනය. | | | | | |
| - නළ එලීම | මීටර 189,972 | මීටර 79,767 | | | |
| - ජල සම්බන්ධතා/ මාරු කිරීම් | නිවාස ඒකක 32,349 | නිවාස ඒකක 3,107 | | | |
| - කලාප මැනුම් ප්‍රදේශ පිහිටුවීම | ප්‍රදේශ 21 | ප්‍රදේශ 03 | | | |
| (ඇ) මාලිගකන්ද ගොඩනැගිල්ල ඉදිකිරීම | සියයට 97 | සියයට 70 | කොන්ත්‍රාත් කාලය දිර්ඝවීමේ සහ පිරිවැය වැඩිවීමේ හැකියාව. | අදහස් දක්වා නොමැත. | වැඩසටහන් කාල සීමාව තුළ නිම කිරීම සඳහා වැඩ කටයුතු කඩිනම් කිරීමට පිළියම් යෙදිය යුතු වීම. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරික්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------------------------ | ------------------------ | ------------------------ | ------------------------ |
| පිළිවෙලින් 2014 ඔක්තෝම්බර් 30 හා 2015 මාර්තු 12 දිනයන්හිදී ප්‍රදානය කරන ලද කොළඹ නගරයේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්වන්හි 2018 දෙසැම්බර් 31 දිනට අඩු ප්‍රගතියක් පෙන්නුම් කරන ලද අතර මෙයට හේතු ලෙස කාණු රහිත ක්‍රමය වෙනුවට විවෘත කාණු ක්‍රමය භාවිතා කිරීම, යන්ත්‍ර උපකරණ භාවිතය වෙනුවට මිනිස් ශ්‍රමය යොදාගැනීමේ තීරණයන් හා රාත්‍රී වැඩ සඳහා අනුමැතියන් යනාදිය විය. | ඒ අනුව කොන්ත්‍රාත් පිරිවැය වැඩි වීමේ හැකියාව. . | අදහස් දක්වා නොමැත. | වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන විසින් වැඩසටහන යටතේ සිදුවන කටයුතු සමීපව නිරීක්ෂණය කළ යුතුය. . |

### 3.3 පරිබාහිර ක්‍රියාකාරකම්

| අනු අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | වැඩසටහනේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, වැඩසටහන මඟින් මිලදී ගන්නා මෝටර් රථ බටහිර කොළඹ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ ආදායම් නොලබන ජල කණ්ඩායම් සඳහා වෙන් කිරීමට සැලසුම් කර තිබුණද, වටිනාකම රු.මිලියන17.97 ක් වටිනා මෝටර් රථ 2 ක් සබරගමුව හා ඌව ප්‍රදේශීය සහය සේවා මධ්‍යස්ථාන වෙත වෙන් කර දී තිබුණි. | අපේක්ෂිත අරමුණු ළඟාකර කර ගැනීමට නොහැකි වේ. | අදහස් දක්වා නොමැත. | අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් භාවිතා කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ. |
| (ආ) | ව්‍යාපෘතියේ අරමුණු වලට පටහැනිව, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවකයින් සඳහා පෙර වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 2.12ක් සහ රු.මිලියන 1.3 ක මුදලක් ගෙවීම් කර තිබුණි. | | අදහස් දක්වා නොමැත. | රේඛීය අමාත්‍යාංශය වෙතින් පිරිවැය ප්‍රතිපූරණය කිරීමට පියවර ගත යුතුය. |